දෙවිනුවර ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය වාරික වශයෙන් ගෙවා තිබූ රු.168,275 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.40,814 ක් වටිනා ලී බඩු හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළව ඉකුත් වර්ෂයේ ලැබී තිබූ රු.120,000 ක ගොඩනැගිලි කුලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් යටතේ රු.4,569,458 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැතියන් රු.3,537,482 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ණයගැතියන් නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ වරෙන්තු ගාස්තු හා දඩ බිල්කිරීම රු.798,030 ක් වුවද එය රු. 760,056 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | ඉකුත් වර්ෂයේ වෙන්දේසියෙන් ඉවත් කර තිබූ ස්ථාවර වත්කම්වල පිරිවැය නිශ්චිතව හඳුනානොගෙන ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමයට රු.762,310 ක් ගිණුම්වලින් ඉවත්කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.307,057 ක විවිධ ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.81,040,613 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.40,840,231 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ශේෂ වෙනසට හේතු සොයා ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම ඉදිරිපත් කිරීමේදී උප ලේඛන සහිතව ඉදිරිපත් කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.220,862,959 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 17 | සියලුම උපපත්‍රිකා පොත් ඇතුළත් කර ලේඛනයක් පවත්වාගෙන යායුතු වුවත් සභාව විසින් ඇතැම් උපපත්‍රිකා පොත් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) රීති 59 | සෑම වර්ෂයකම ආරම්භයේදී කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) රීති 61 | කර්මාන්ත බද්දට අදාල ලේඛනයක් පී.එස්. 26 ඒ ආකෘති පත්‍රය ප්‍රකාරව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව තුලනය කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර් ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) රීතිv 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (vi) රීති 217 සහ 218 | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර ඇතුළත් කර පී.එස්.46 දරන ආකෘතියේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරික්ෂාවක් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.27,603,602 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.26,179,646 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,259,839 | 5,662,880 | 5,957,833 | 3,867,108 | 3,357,100 | 5,717,385 | 5,542,817 | 4,162,061 |
| කුලී | 20,013,272 | 22,551,481 | 23,094,744 | 9,163,348 | 27,965,850 | 21,354,382 | 21,354,382 | 9,706,611 |
| බලපත්‍ර ගාස්තු | 3,949,486 | 860,113 | 860,113 | -- | 3,059,900 | 529,864 | 529,864 | -- |
| වෙනත් ආදායම් | 21,188,620 | 65,059,111 | 52,844,873 | 66,140,638 | 17,267,000 | 17,937,843 | 17,937,843 | 53,926,400 |
| **එකතුව** | 47,411,217 | 94,133,585 | 82,757,563 | 79,171,094 | 51,649,850 | 45,539,474 | 45,364,906 | 67,795,072 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු. 47,411,217 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.67,795,072 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.94,133,585 ක් සමඟ රු.161,928,657 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුලදී මුළු අයවීම් රු.82,757,563 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.79,171,094 ක් විය. අයවීමේ ප්‍රගතිය සියයට 51 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයවිය යුතු හිඟ මුදල් අයවීමේ ප්‍රගතිය වැඩිකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.4,103,954 ක් වූ අතර, රු.2,019,116 ක් වූ වර්ෂයේ බිල්කිරීම් (දඩ සමඟ) සමග රු.6,123,070 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.2,229,967 ක් වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 3,893,103 ක හිඟ ශේෂයක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම්, බිල් කළ හා වර්ෂයේ ආරම්භයේ හිඟ ශේෂයෙන් සියයට 36 ක් තරම් අවම මට්ටමක පැවතුණි | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | දේපළ තහනම් කිරීමේ දැන්වීම් බෙදා දෙමින් හිඟ වරිපනම් බදු එකතු කිරීමට කටයුතු කර ඇත. |

**(ආ) අක්කර බදු**

| | | |
|---|---|---|
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.66,428 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් (ගාස්තු හා දඩ සමග ) රු.6,754 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.16,495 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.56,687 ක් හිඟව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම් බිල් කිරීම් හා හිඟ ශේෂයෙන් සියයට 23 ක් තරම් අවම මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | අක්කර බදු දේපළ සම්බන්ධව සභාව මගින් පත් කර ඇති සමීක්ෂණ කමිටුව අදාල දේපළ හඳුනාගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. |

## 2.2.4 බදු කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟ කුලී ශේෂය රු.9,706,611 ක් වූ අතර, රු.4,431,360 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.14,137,971 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම් රු.4,974,623 ක් වීම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයට රු.9,163,348 ක් හිඟව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම්, බිල් කිරීම් හා හිඟ ශේෂයෙන් සියයට 35 ක් තරම් අවම මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | වර්ෂයට අදාලව අවසන් නිවේදන යවා හිඟ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කර ඇත. |

## 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.2,522,847 ක් හා මුද්දර ගාස්තු රු.61,988,240 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ප්‍රධාන ලේකම් වෙත මුදල් ලබාදෙන ලෙස කිහිප අවස්ථාවකදීම ලිඛිතව ඉල්ලීම් කර ඇති අතර ඉදිරියේදී ඉල්ලීම් කර මෙම මුදල් ලබාගැනීමට කටයුතු කරමි. |

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්ය සාධන ඇගයීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 දෙසැම්බර් 11 වැනි දින සභාව විසින් දෛනිකව රැස්කරන කසළ බැහැර කිරීම සඳහා සභා අරමුදලින් රු.2,700,000 ක් වැයකර අපරැක්ක ප්‍රදේශයෙන් අක්කර 04 ක ඉඩමක් මිලදී ගෙන තිබුණු අතර මහජන විරෝධය නිසා එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි මාතර තංගල්ල ප්‍රධාන මාර්ගයට යාබඳ පෞද්ගලික ඉඩමකට අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා අවට පිහිටි විශ්ව විද්‍යාලයට, පාසල හා මහජනයාට පාරිසරික ගැටළු වලට මුහුණ දීමට සිදු වී ඇත. | විධිමත් ලෙස කසල බැහැර කළ යුතුවේ. | වැල්ලමඩම කසළ බැහැර කරන ස්ථානයට 2019 මැයි 21 දින සිට දිරන කසළ පමණක් දැමීමටත් නොදිරන කසළ වෙනම එකතු කර වර්ග කර ඉවත් කිරීමටත් කටයුතු ආරම්භ කර ඇත. |

**(ආ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකරගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේදී ආයතනය මඟින් නිශ්චිතව හඳුනාගත් තිරසර සංවර්ධන දර්ශක පදනම් කරගෙන ආයතනයේ දිගුකාලීන සැලැස්ම සකස් කරමි. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ----------------- |
| (අ) | අංක 2052 හා 2017 දෙසැම්බර් 29 දිනැති ගැසට් පත්‍රයේ විධි විධාන ප්‍රකාරව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර, 2019 මාර්තු 01 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සභා බල ප්‍රදේශයේ සවිකර ප්‍රදර්ශනයකර තිබූ දැන්වීම් පුවරු 71 ක් වෙනුවෙන් රු.308,137 ක ගාස්තුවක් අයකර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර ගාස්තු අය කිරීම සඳහා නිවේදන යොමු කර ඇති අතර 2019 වර්ෂය සඳහා ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2052 දරන ගැසට් පත්‍රය ප්‍රකාර දුරකථන, ගුවන් විදුලි, රූපවාහිනි සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳව තහවුරු කිරීමක් ලබාගෙන නොතිබුණි. 2019 පෙබරවාරි 26 දින ආදායම් පරීක්ෂක විසින් විවිධ දුරකථන සමාගමවලට අයත් සම්ප්‍රේෂණ කුළුණු 06ක් ස්ථානගත කර තිබූ බවට වාර්තා ඉදිරිපත් කර තිබුණද ඒවායින් සමාලෝචිත වර්ෂය සඳහා රු.18,000 ක ගාස්තුවක් අයකරගෙන නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2006 ජූලි 27 දිනැති පී.එල්/7/8/36 දරන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලිපියේ සඳහන් පරිදි කටයුතු කර ඇත. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ----------------- |
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>---------------------------------- | | |
| (i) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 08 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 19 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කරමි. |
| (ii) | අංක G/SP/1/1/3-17 හා 2018 අගෝස්තු 08 දිනැති දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ ලිපිය මගින් අනුමැතිය ලැබී තිබූ සෞඛ්‍ය කම්කරු තනතුරක සහ වැඩ ක්ෂේත්‍ර කම්කරු | ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එම පුරප්පාඩු සඳහා ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | තනතුරක පුරප්පාඩු දෙක සම්පූර්ණ කිරීම සඳහා 2018 ඔක්තෝම්බර් 18 වන දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබුණද 2019 පෙබරවාරි 28 දින වන විටත් එම පුරප්පාඩු දෙක සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | නියමිත රාජකාරි පැවරීමකින් තොරව වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් තුන්දෙනෙකු සහ සෞඛ්‍ය කම්කරුවෙකු කාර්යාලයේ සේවය සඳහා යොදවා තිබීම නිසා මහජන සුභසාධන හා සෞඛ්‍ය කටයුතු, මාර්ග නඩත්තු කටයුතුවලට බාධා පැමිණ තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පමණක් සභා අරමුදලින් රු.1,527,618ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | නියමිත රාජකාරියේ යෙදවිය යුතුවේ. | සේවයේ අවශ්‍යතාවය මත ප්‍රාදේශිය සභා පනතින් සභාපතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අදාල තනතුරු බඳවා ගැනීම් සිදුකර ඇති අතර ඔවුන් වෙත ලිඛිතව රාජකාරි පවරා සේවයේ යොදවා ඇත. |
| (ඇ) | ස්ථිර සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් තුන් දෙනෙකු සහ ආදේශක වැඩ ක්ෂේත්‍ර කම්කරුවෙකු කාර්යාලයේ සේවයේ යොදවා තිබියදී සමාලෝචිත වර්ෂයේදී ආදේශක පදනම මත සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් අට දෙනෙකු බඳවා ගෙන තිබුණි. බඳවාගෙන තිබූ එක් සෞඛ්‍ය කම්කරුවෙකුද කාර්යාලයේ සේවය සඳහා යොදවා තිබුණි. | නියමිත රාජකාරියේ යෙදවිය යුතුවේ. | කාර්යාලයේ හා පිටත අත්‍යාවශ්‍ය කටයුතු සඳහා සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය වූ බැවින් අනුමැතියක් ලබාගෙන මෙසේ බඳවා ගැනීම් සිදු කර ඇත. |
| **(ඈ)** | **සේවක ණය**<br>--------------<br>සේවක ණය ලේඛනය අනුව 2011 වර්ෂයේ සිට වාරික ගෙවීම් පැහැර හැර ඇති සේවකයින්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.10,717 ක් විය. | කඩිනමින් හිඟ ණය ශේෂ අයකළ යුතුවේ. | ඉදිරියේදී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | -------------------------------- |
| (අ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර තිබූ අංක 392/7 හා 1986 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුබෙදීම් කළ අක්කර 9 රූඩ් 1 පර්චස් 35.26 | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම ඉඩමෙන් සම්පූර්ණයෙන් පොදු කටයුතු සඳහා හිමි විය යුතු මුළු ඉඩමෙන් 10% ප්‍රමාණයෙන් ඉතිරි ඉඩම් කොටස සභාව වෙත |

| | | | |
|---|---|---|---|
| | (වීථි හැර) ක වපසරියෙන් යුත් ඉඩමෙහි සභාවට හිමි විය යුතු රූඩ් 3 පර්චස් 31.526 ක ඉඩම් කොටස වෙනුවට සභාවට ලැබී තිබුණේ පර්චස් 68.29 ක් පමණි. | | පැවරීමට කටයුතු කරන ලෙස මගේ අංක දෙවි/ප්‍රාස/සං.අ/ඉ.අ/2019 හා 2019 මැයි 21 දිනැති ලිපිය අදාළ සමාගම වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | දෙවිනුවර කපුගම පිහිටි මැදගොඩහේන වත්ත නමැති ඉඩමෙහි බෙදා වෙන් කරන ලද පර්චස් 15.33 ක අංක 34 කැබැල්ල 2004 ජුනි 21 දිනැති පැවරුම්කරයෙන් සභාවට ලබා දී තිබූ අතර සභාපති විසින් 2006 පෙබරවාරි 13 දින අංක 10980 විකුණුම්කරයෙන් බාහිර පුද්ගලයෙකුට විකුණා තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගෙන ඉඩම සභාවට පවරා ගත යුතුවේ. | මෙම ඉඩමේ අයිතිය නැවත දෙවිනුවර ප්‍රාදේශීය සභාවට ලබාගැනීම සඳහා නීතිමය කටයුතු කිරීමට අදාලව ලිපි ගොනුවක් සකස් කර ප්‍රාදේශිය සභාවේ නඩු කටයුතු සිදු කරන නීතීඥ මහතා වෙත භාරදී ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙවිනුවර ඇසළ සල්පිල් සඳහා තාවකාලික කඩ හා බිම් අල්ලි ලබාදීමේදී නියමිත ක්‍රමවේදය අනුගමනය නොකිරීම හේතුවෙන් සභාවට රු.4,016,300 ක ආදායමක් අහිමි වී තිබුණි. | ටෙන්ඩර් කැඳවා බදුදීම කළ යුතුවේ. | ඇතැම් ස්ථාන වල භූමියේ තිබූ පිහිටීම අනුව කඩ අලෙවි කර ගැනීමට නොහැකි වූ අතර ඇතැම් වෙළඳුන් තම වෙළඳ ස්ථානයට ආසන්න ටෙන්ඩර් මඟින් ලබා නොගත් කඩවල වෙළඳ ද්‍රව්‍ය තබා තිබුණි. |

**3.5 වත්කම් කළමණාකරණය**

---------------------------

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක දපපා/15 හා 2007 මාර්තු 19 දිනැති දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු සෑම දේපලකම වැට මායිම් දමා එයට අනවසරයෙන් ඇතුළුවීමට නොහැකිවන සේ පවත්වාගෙන යාමට සහ ගැටළු සහගත තත්ත්වයේ ඇති ඉඩම් නැවත මැන මායිම් නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභාව සතු සෑම දේපලකම ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 2019 වර්ෂයේ අයවැයෙන් මුදල් වෙන්කර ඇති අතර ඉදිරි වර්ෂයේදී ඒ අනුව කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පොදු කටයුතු සඳහා සභාවට හිමිවී තිබූ මීරිස්වත්ත නැමැති පර්චස් 68.29 ක් වූ ඉඩමේ කොටසක පුද්ගලයන් දෙදෙනෙකු විසින් නිවාස දෙකක් අනවසරයෙන් ඉදිකරමින් පැවතුන අතර සභාව සතු වත්කම් අවභාවිතය පිළිබඳව හා අනවසර ඉදිකිරීම් පිළිබඳව සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතුවේ. | සභා අනුමැතියක් ගෙන අදාල අනවසර කරුවන් දැනුවත් කර බිම් බද්දක් අයකිරීමට කටයුතු කරමි. |

### 3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් අයකර නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු අපරක්ක උපකාර්යාලයේ කොටසක් 2011 ජනවාරි 06 දින මාසික සභා රැස්වීම් අංක 03:01 යටතේ 2011 ජනවාරි 15 වන දින සිට රු.3000 ක මාසික බදු පදනම මත විවිධ සේවා සමූපකාර සමිතියක් වෙත ලබා දී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන දිනවන විටත් කිසිදු කුලී මුදලක් අයකරගෙන නොතිබුණි. මෙම කාර්යාලය කොටසේ ග්‍රාමීය බැංකුවක් පවත්වාගෙන යන බව 2019 පෙබරවාරි 25 දින ක්ෂේත්‍ර විගණන පරික්ෂාවේදී නිරීක්ෂණය විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී තාක්ෂණ නිලධාරී මගින් සැලැස්මක් සකස් කිරීමටත් බදු ගිවිසුම් ගත වීමටත් ප්‍රධාන තක්සේරුකරු වෙත යොමු කර ඇති අතර තක්සේරු වාර්තාවක් ලබාගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | 2014 වර්ෂයේදී ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමෙන් අයවිය යුතු රු.147,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධව 2019 අප්‍රේල් 30 දින ගරු ආණ්ඩුකාරතුමා දුන් උපදෙස් පරිදි කටයුතු කරමි. |

### 3.5.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජන වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ඉඩම් හා ගොඩනැගිලි** | | |
| සභාව සතු අක්කර 04 රූඩ් 02 පර්චස් 05 කින් යුත් ඉඩම් කැබලි 07 ක් හා මිනුම් නොකළ ඉඩමක් ඵලදායී කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි. | ඵලදායී කාර්යයන් සඳහා යොදාගත යුතුවේ. | සභාව සතු අක්කර 4යි පර්චස් 85 ක ඉඩම හඳුනාගෙන මිනුම් කර ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) මෝටර් රථ හා කරත්ත** | | |
| සභාව සතු රු.662,000 ක් වටිනා ට්‍රැක්ටරය, වටිනාකම සඳහන් නොවූ අත් ට්‍රැක්ටර් 02 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. මේ සම්බන්ධයෙන් 2015 ජූනි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරමි. |

### 3.6 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2008 මාර්තු 11 දින සභාවට ලැබී පළාත් යාන්ත්‍රික ඉංජිනේරු විසින් අවම වටිනාකම රු.300,000 කට තක්සේරු කර තිබූ ත්‍රීරෝද රථයක් ඉකුත් වර්ෂයේදී රු.20,400 කට වෙන්දේසි කර තිබුණි. 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව මෙම රථය අලුත්වැඩියාවට හෝ අපහරණයට කිසිදු නිර්දේශයක් ලබා දී නොතිබුණි. | විමර්ශනයක් පවත්වා අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | ත්‍රී රෝද රථය ධාවන තත්ත්වයේ නොතිබූ බැවින් රථය අලුත්වැඩියා කරන්නේද, නැතහොත් අපහරණය කරන්නේදැයි යාන්ත්‍රික ඉංජිනේරුවරයාගෙන් වාර්තාවක් ලබාගෙන නොතිබුණි. |
| | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාරව සභා දේපළ ටෙන්ඩර් කර බඳු දීම කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙවිනුවර ඇසළ | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2016 වර්ෂයේදී ටෙන්ඩර් ක්‍රමවේදය යටතේ කඩ විකිණීමට සභාව කටයුතු |

| | | |
|---|---|---|
| සල්පිල සඳහා කඩ කාමර සහ බිම් අල්ලි 919 ක් ටෙන්ඩර් කිරීමකින් තොරව ලබාදී තිබුණි. | | කළ නමුත් ප්‍රදේශයේ ජනතාවගෙන් වූ කරුණු දැක්වීම හේතුවෙන් මහ ඇමතිතුමා විසින් එම ටෙන්ඩර් ක්‍රමවේදයෙන් බැහැරව මෙතෙක් සිදු කළ අයුරින් කඩ ලබාදෙන ලෙස දැන්වීම නිසා සෑම වසරකම සිදු කළ පරිදි ටෙන්ඩර් නොකර වෙළඳුන්ට කඩ විකිණීමට කටයුතු කළෙමි. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ විවිධ අරමුදල් යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග 04 ක් කොන්ක්‍රීට් කිරීමේදී නියමිත ප්‍රමාණයට කොන්ක්‍රීට් නොකිරීම නිසා රු.46,656 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් කඩිනමින් අයකළ යුතුවේ. | මාර්ග 4ක වැඩිපුර ගෙවා ඇති මුදල් අදාල කර්මාන්තයන්හි රැඳවුම් මුදලින් අඩුකර ගැනීමට කටයුතු කරමි. |

**04.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 06 ක ඉතිරි කිරීම් වල එකතුව රු. 24,759,353 ක් වූ අතර, එම අගයන් සියයට 22 සිට සියයට 148 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයේ අයවැය ගත තත්‍ය ආදායම් හා වියදම් ඵලදායී ලෙස කළමනාකරණය කර නිසි ලෙස යොදා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.14,276,148 ක් වූ අතර, එම අගයන් සියයට 02 සිට සියයට 359 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයේ අයවැය ගත තත්‍ය ආදායම් හා වියදම් ඵලදායී ලෙස කළමනාකරණය කර නිසි ලෙස යොදා ගැනීමට කටයුතු කරමි. |